# ඉන්දියානු නිවාස ව්‍යාපෘතිය - සිව්වන අදියරේ දෙවන පියවර
# දියත් කිරීමේ අවස්ථාව

(බණ්ඩාරවෙල, 2025 ඔක්තෝබර් 12)

## ඉන්දියානු මහ කොමසාරිස්තුමාගේ කතාව

ගරුතර පූජ්‍ය පක්ෂයෙන්ද,

ශ්‍රී ලංකා ජනාධිපති අතිගරු අනුර කුමාර දිසානායක මැතිදුන්ගෙන්ද,

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍ය ගරු සමන්ත විද්‍යාරත්න මැතිදුන්ගෙන්ද,

ධීවර, ජලජ සහ  සාගර සම්පත් අමාත්‍ය ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මැතිදුන්ගෙන්ද,

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍ය ගරු සුන්දරලිංගම් ප්‍රදීප් මැතිදුන්ගෙන්ද,

සංචාරක නියෝජ්‍ය අමාත්‍ය ගරු මහාචාර්ය රුවන් රණසිංහ මැතිදුන්ගෙන්ද,

තරුණ කටයුතු නියෝජ්‍ය අමාත්‍ය ගරු දිනිදු සමන් කුමාර මැතිදුන්ගෙන්ද,

ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන්ද,

ගරු ආණ්ඩුකාරවරුන්ගෙන්ද

සම්භාවනීය අමුත්තන්ගෙන්ද,

ඉන්දීය සම්භවයක් සහිත දමිළ ප්‍රජාවේ ආදරණීය සාමාජිකයින්ගෙන්ද අවසරයි.

වනක්කම්, ආයුබෝවන්, නමස්කාර්!

ඉන්දියානු නිවාස ව්‍යාපෘතියේ සිව්වන අදියරෙහි දෙවන පියවර දියත් කරනු ලබන මෙම විශේෂ අවස්ථාව හා එක්වීමට ලැබීම මා ලද ඉමහත් ප්‍රීතියක් මෙන්ම තෘප්තියකි.

මෙම අවස්ථාවට අතිගරු ජනාධිපති දිසානායක මැතිතුමාගේ සම්ප්‍රාප්තිය අප ලද විශාල ගෞරවයකි. මෙය ඉන්දු-ශ්‍රී ලංකා මිත්‍රත්වයේ ගැඹුරු, නොවෙනස් සහ සුවිශේෂී ස්වභාවයට වන සාක්ෂියකි. එය අප ජනතාවගේ සංවර්ධනය හා යහපැවැත්ම උදෙසා වන අපගේ පොදු කැපවීම ද පිළිබිඹු කරයි.

එම පොදු කැපවීම මෙම වසරේ අප්‍රේල් මාසයේ ඉන්දීය අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මහතාගේ සංචාරයේදී නැවත තහවුරු විය. අගමැති මෝදි මහතාගේ නායකත්වය යටතේ, ඉන්දියාව 'සබ්කා සාත්, සබ්කා විකාස්' යන තේමා පාඨය සමඟින් 'වික්සිත් භාරත්' හෙවත් සංවර්ධිත ඉන්දියාවක් දෙසට ගමන් කරමින් සිටියි. ජනාධිපති දිසානායක මහතාගේ මඟ පෙන්වීම යටතේ, ශ්‍රී ලංකාව ද 'පොහොසත් රටක් ලස්සන ජීවිතයක්' කරා යන පරිවර්තනීය මාවතකට අවතීර්ණ වී ඇත.

අද උත්සවය සැබවින්ම ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ ජනතාව එක් කරන ඉතිහාසයේ මිත්‍රත්වයේ සහ නොබිඳිය හැකි බැඳීමේ සැමරීමකි. අපි සහෝදර සහෝදරියන්ය; අපි ශිෂ්ටාචාරමය නිවුන් දරුවන්ය. අපි සාමය, ගෞරවය සහ විශිෂ්ට අවස්ථාවන් සමඟ ජීවත් වන, අපේ අතීතයට වඩා දීප්තිමත් අනාගතයක් සොයමින් සිටිමු.

අපගේ ඉන්දියානු සම්භවයක් සහිත ශ්‍රී ලංකාවේ දමිළ සහෝදර සහෝදරයින් අපගේ ජාතීන් දෙක අතර ජීවමාන පාලමකි. ඉන්දියාවේ සහ ප්‍රජාවේ සම්බන්ධතාවය පොදු සංස්කෘතික, භාෂාමය, සහ අන්තර් පුද්ගල සබඳතා ඔස්සේ ගැඹුරට දිව ගොස් ඇත. කාලයත් සමඟින් මෙම සම්බන්ධතාවය වඩාත් ශක්තිමත් වී ඇත.

අපගේ ඉන්දියානු සම්භවයක් සහිත ශ්‍රී ලංකාවේ දමිළ සහෝදර සහෝදරයින් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට දායක වෙමින්, එහි සංස්කෘතිය පොහොසත් කරමින්, එහි සමාජ ව්‍යුහය ශක්තිමත් කරමින් ශ්‍රී ලංකාවේ ගමන් මගෙහි නිත්‍ය අංගයක් වී ඇත. ඔවුන්ගේ කතාව දරා ගැනීම සහ අධිෂ්ඨානය පිළිබඳ කතාවකි.

සෑම විටම අපගේ අරමුණ වන්නේ මෙම ප්‍රජාවේ සෑම සාමාජිකයෙකුගේම සවි බල ගැන්වීම, නඟා සිටුවීම සහ පූර්ණ සංවර්ධනය සහතික කිරීමයි. මෙම ගමනේදී ඉන්දියාව ශ්‍රී ලංකා රජයේ ස්ථිර හවුල්කරුවෙකු වී ඇත. නිවාස, අධ්‍යාපනය සහ කුසලතා සංවර්ධනය, සෞඛ්‍ය සේවා සහ ප්‍රජා සංවර්ධනය වැනි ක්ෂේත්‍රවල අපි අත්වැල් බැඳගෙන කටයුතු කරන්නෙමු.

අද අපි රැස්ව සිටින්නේ ඉන්දීය රජයේ සහයෝගය ඇතිව ඉන්දියානු සම්භවයක් ඇති දෙමළ ප්‍රජාව සඳහා වන නිවාස වැඩසටහන ඉදිරියට ගෙන යාමටයි. සමස්තයක් වශයෙන්, නිවාස 14,000 ක් සඳහා ආධාර ලබා දෙන බවට ප්‍රකාශයට පත් කර ඇත. තුන්වන අදියර යටතේ නිවාස 4,000 ක් අවසන් කර ඇත. ඉතිරිව ඇත්තේ ඉතා ස්වල්පයක් පමණි.

2017 වර්ෂයේ දී අග්‍රාමාත්‍ය මෝදි මැතිතුමන් නිවාස ව්‍යාපෘතියේ IV අදියර යටතේ තවත් නිවාස 10,000 ක් සඳහා ආධාර ලබාදෙන බවට ප්‍රකාශ කළේය. දැනට එයින් නිවාස 1,100 ක් ඉදිවෙමින් පවතී. අද අපි මෙම ව්‍යාපෘතියේ ඊළඟ පියවර දියත් කරමු.

මෙම අදියර ආරම්භ කිරීම සඳහා වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය දැක්වූ උද්‍යෝගය සහ සහයෝගය වෙනුවෙන් අපගේ පැසසුම පළ කිරීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි.

අතිගරු ජනාධිපතිතුමනි, නෝනාවරුනි මහත්වරුනි,

නිවාස ලබාදීම සඳහා ඉන්දියාවේ කැපවීම හේතුවෙන් අද වන විට ශ්‍රී ලංකාව පුරා නිවාස 65000 ක් ඉදිකර ඇත. එය රටේ සියලුම දිස්ත්‍රික්ක 25 ආවරණය කරයි. අද වන විට එය ශ්‍රී ලංකා රුපියල් බිලියන 64 කට අධික ප්‍රධානයකි. මෙම දැවැන්ත මුලපිරීම පවුල් දහස් ගණනකගේ ජීවිත පරිවර්තනය කර ඇත. එය ඔවුන්ට සෙවනක් සලසයි. එමගින් ගෞරවය සහ ඉහළ නංවන ලද ජීවන තත්ත්වයන් තහවුරු කරයි.

අපගේ අරමුණ වන්නේ හුදෙක් නිවාස ඉදිකිරීම පමණක් නොව අනාගතය ගොඩනැගීමයි. අධ්‍යාපනයේ සිට සෞඛ්‍ය සේවා දක්වා, කුසලතා සංවර්ධනයේ සිට සමාජ යටිතල පහසුකම් දක්වා ලක්ෂ සංඛ්‍යාත ජීවිත ස්පර්ශ කරන අංශ හරහා අපි මුලපිරීම් ක්‍රියාත්මක කරමින් සිටිමු.

අපි දික්ඔය බහු-විශේෂ රෝහල සහ මාතලේ මහත්මා ගාන්ධි ජාත්‍යන්තර මධ්‍යස්ථානය ඉදිකර ඇත. අපි අධ්‍යයන මධ්‍යස්ථාන ගණනාවක යටිතල පහසුකම් වැඩිදියුණු කර ඇත. අපි වතුකරයේ පාසල් කිහිපයක Smart පන්ති කාමර ස්ථාපිත කරමින් තිබේ. අපි ලංකා වතු කම්කරු අධ්‍යාපන භාරය හරහා ශිෂ්‍යත්ව ලබා දෙමින් ඇත. අපි වතුකරයේ පාසල් වැඩිදියුණු කිරීම සඳහා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරමු. ඉන්දියානු සම්භවයක් ඇති දෙමළ ප්‍රජාව සඳහා අපි ක්‍රියාත්මක කර ඇති බොහෝ ව්‍යාපෘති සඳහා මේවා උදාහරණ කිහිපයක් පමණි.

2023 දී, ශ්‍රී ලංකාවට මෙම ප්‍රජාව පැමිණ වසර 200 ක් ගතවීම සනිටුහන් කිරීම සඳහා, අපි ශ්‍රී ලංකා රුපියල් බිලියන 2.5 කට අධික වටිනාකමකින් යුත් විශේෂ සංවර්ධන පැකේජයක් ප්‍රකාශයට පත් කර ඇත්තෙමු. මෙම පැකේජය යටතේ බොහෝ ව්‍යාපෘති ක්‍රියාත්මක වෙමින් පවතී. පසුගිය වසරේ අපි STEM ගුරු පුහුණු වැඩසටහනක් සම්පූර්ණ කළෙමු. එයින් වතුකරයේ පාසල් ගුරුවරුන් 2,000 කට අධික සංඛ්‍යාවකට ප්‍රතිලාභ සැලසුණි. එම පැකේජය යටතේ නව ව්‍යාපෘති කඩිනම් කරන ලෙස අපි ශ්‍රී ලංකා රජයෙන් ඉදිරියටත් ඉල්ලා සිටිමු.

හැකි ඉක්මනින් මෙම පැකේජයේ ප්‍රතිලාභ ජනතාවට ළඟා වන බවට එමගින් තහවුරු වනු ඇත.

මෑතකදී සිදු කළ රාජ්‍ය සංචාරයේදී අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමා සීතා අම්මාන් කෝවිල සංවර්ධනය කිරීම සඳහා සහාය පළ කළේය. මෙය සංචාරක ව්‍යාපාරය නඟා සිටුවීමට සහ වතුකරයේ ප්‍රජා සාමාජිකයින් අතර ඒ ආශ්‍රිත කර්මාන්ත ශක්තිමත් කිරීම සඳහා හේතු වනු ඇත. අනෙක් අතට, මෙය කලාපයේ ආර්ථික හා සමාජීය සංවර්ධනයට මින් ඉදිරියටත් දායක වනු ඇත.

ඉන්දියාව ශ්‍රී ලංකාවට ලබා දෙන සංවර්ධන ආධාර වගකීමක් පිළිබඳ හැඟීමකින් යුක්ත බව අග්‍රාමාත්‍ය මෝදි මැතිතුමා පවසා තිබේ. එය පවුලේ සාමාජිකයෙකු කෙරෙහි කෙනෙකුට දැනෙන වගකීමකි. අපි සමස්ත ශ්‍රී ලංකාවේම සංවර්ධනය සඳහා කටයුතු කිරීමට කැපවී සිටිමු. ශ්‍රී ලංකාවට අපගේ ස්ථිර සහයෝගය පළකරමු. ඉන්දියානු සම්භවයක් ඇති දෙමළ ප්‍රජාව සඳහා අපගේ සහයෝගය මෙම සමස්ත ප්‍රයත්නයේ කොටසකි.

මෙම හැඟීම මැනවින්ම ඉදිරිපත් කරනු ලබන්නේ මහා කවියෙකු සහ සාන්තුවරයෙකු වූ තිරුවල්ලුවර්ගේ වදන් වලිනි.

එහි පරිවර්තනය වන්නේ,

"ඥාතියෙකුගේ නොවෙනස්වන ආදරය අසීමිත වර්ධනයේ මූලාශ්‍රයකි," යන්නයි.

අතිගරු ජනාධිපතිතුමනි, නෝනාවරුනි මහත්වරුනි,

අප වර්ධනය සහ සෞභාග්‍යය කරා යන ගමනේදී ඔබෙන් බලාපොරොත්තු වන්නේ මෙයයි.

ශ්‍රී ලාංකික ජනතාවගේ සුබ සාධනය, ප්‍රගතිය සහ සෞභාග්‍යය සඳහා ඉන්දියාවේ අප්‍රතිහත කැපවීම නැවත තහවුරු කිරීමට මා මෙය අවස්ථාවක් කර ගනිමි.

අප තව නොබෝ දිනකින් ආලෝකය, ප්‍රීතිය සහ සෞභාග්‍යය සඳහා වූ උත්සවය වන දීපවාලිය සමරන්නෙමු. දීපවාලියේ පහන්වලින් අපගේ නිවාස ආලෝකමත් වනු ඇත. ඒ ආකාරයෙන්ම, ඉන්දියානු නිවාස ව්‍යාපෘතිය යටතේ ඉදි වූ මෙම නිවාසවලින් අප්‍රමාණ ජීවිත ඒකාලෝක වේවා. එසේම ඉන්දියානු රජයේත් ශ්‍රී ලංකා රජයේත් ඒකාබද්ධ උත්සාහයන් අපගේ ජනතාවගේ ජීවිතවලට සෞභාග්‍යය ගෙන ඒවා.

බොහොම ස්තූතියි!